AAT Level – 01

# ECONOMICS
# (ECN)

# ජාතික ගිණුම්කරණය

## Tute – 04

**Prepared by - Chinthaka Kelum Udayasiri**
**Visiting Lecturer – University of Colombo**
BBA (SP) Mgt (University of Colombo)
Gold medalist (University of Colombo)
CIM (UK) Passed Finalist
AAT Passed Finalist
Dip in Strategic Brand Management (SLIM)
Dip in Digital Marketing (APIDM)

JMCvLearning "your virtual learning partner"

# අන්තර්ගතය


- සාර්ව ආර්ථිකය සහ ව්‍යාපාර පරිසරය
- ව්‍යාපාර චක්‍රය හා ව්‍යාපාර කෙරෙහි එහි බලපෑම
- ජාතික ආදායමේ වෘත්තාකාර ප්‍රවාහය
- ජාතික ආදායම් ගිණුම්කරණය
- ජාතික ආදායම් ගිණුම්කරණයට ඇති විවිධ ප්‍රවේශ
- ආණ්ඩුවේ අසමත් වීම්
- රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය හා එහි උපකරණ
- සාර්ව ආර්ථික මිනුම්


JMC vLearning "your virtual learning partner"






JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

## සාර්ව ආර්ථිකය සහ ව්‍යාපාර පරිසරය

ආර්ථික පද්ධතියක් සමස්තයක් ලෙස ගෙන එහි ක්‍රියාකාරිත්වය විශ්ලේෂණය කිරීම සාර්ව ආර්ථික විද්‍යාව තුළින් සිදු කෙරේ. ආර්ථිකයේ සමස්ත ක්‍රියාකාරිත්වය රඳා පවතින්නේ සාර්ව ආර්ථික විචල්‍යයන් මතය. සමස්ත ආර්ථිකය තුළ ක්‍රියාත්මක වන සාර්ව ආර්ථික විචල්‍යයන් හා සාර්ව ආර්ථික ප්‍රශ්න පිළිබඳව සාර්ව ආර්ථික විද්‍යාවේදී සාකච්ඡා කෙරේ. සාර්ව ආර්ථික විචල්‍යයන් ලෙස වැටුප් මට්ටම, ගෙවුම් ශේෂය, සමස්ත මිල මට්ටම, මුදල් ඉල්ලුම, මුදල් සැපයුම, විනිමය අනුපාතය, සේවා නියුක්තිය හා අන්තර්ජාතික වෙළෙඳ කටයුතු හැඳින්විය හැකි අතර සේවා වියුක්තිය, උද්ධමනය, විනිමය අනුපාතය පිරිහීම, ගෙවුම් ශේෂ දුෂ්කරතා යනාදිය ප්‍රධාන සාර්ව ආර්ථික ප්‍රශ්න ලෙස හැඳින්විය හැකිය.

සූක්ෂම ආර්ථික විද්‍යාව යටතේ ආර්ථික යේ එක් එක් අංශ, පුද්ගලයන්, ආයතන හා ආර්ථික විචල්‍ය කුඩා ඒකක වශයෙන් වෙන් වෙන්ව ගෙන අධ්‍යයනය සිදු කරන අතර සාර්ව ආර්ථික විද්‍යාව යටතේ සූක්ෂම ආර්ථික විද්‍යාව යටතේ අධ්‍යයනය කළ කුඩා ඒකක සියල්ල එකතු කොට මුළු ආර්ථිකයම සමස්තයක් ලෙස ගෙන අධ්‍යයනය කරයි.

- රටක සාර්ව ආර්ථික අරමුණු

- මිල ස්ථායිතාවය
- පූර්ණ සේවා නියුක්තිය
- ගෙවුම් ශේෂ සමතුලිතතාවය
- සාධාරණත්වය
- තිරසාර සංවර්ධනය
- ආර්ථික වෘද්ධිය වේගවත් කර ගැනීම


JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

- සාර්ව ආර්ථික ප්‍රතිපත්ති

සාර්ව ආර්ථික කළමනාකරණය සඳහා යොදා ගැනෙන ආර්ථික ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ලෙස හැඳින්වේ.

මූල්‍ය ප්‍රතිපත්තිය

මුදල් සැපයුම, ණය සැපයුම, පොළී අනුපාතිකයට සිදු කරන බලපෑම් තුළින් මුදල් සැපයුම වෙනස් කිරීම මූල්‍ය ප්‍රතිපත්තිය තුළින් සිදු වේ. මූල්‍ය ප්‍රතිපත්තියේ ප්‍රධාන උපකරණ ලෙස මුදල් සැපයුමත් පොලී අනුපාතයත් හැඳින්විය හැකිය.

පිස්කල් ප්‍රතිපත්තිය

රාජ්‍ය ආදායම, රාජ්‍ය වියදම හා රාජ්‍ය ණය වෙනස් කිරීමට පියවර ගැනීම මෙම ප්‍රතිපත්තිය මගින් සිදු කෙරේ. රජයේ වියදම් ද, රජයේ බදු ද රාජ්‍ය ණය ද පිස්කල් ප්‍රතිපත්තියේ ප්‍රධාන උපකරණ ලෙස සැලකේ.

- ව්‍යාපාර චක්‍රය හා ව්‍යාපාර කෙරෙහි එහි බලපෑම

කාලයත් සමඟ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ ඉහළ හා පහළ යාම හැඳින්වෙන්නේ ව්‍යාපාර චක්‍ර ලෙසය



JMC vLearning "your virtual learning partner"

නිෂ්පාදනය දිගු කාලයක් තිස්සේ අඛණ්ඩ ලෙස ඉහළ යාම ආර්ථික ප්‍රසාරණයක් හෙවත් ආර්ථික උත්පාතයක් ලෙස හඳුන්වනු ලබයි. එලෙසම නිෂ්පාදනය පහළ වැටීම ආර්ථික පසුබැසීමත් හෙවත් ප්‍රතිගමනයක් ලෙස හඳුන්වනු ලබන අතර එම පහත වැටීම දිගුකාලයක් පැවතීම ආර්ථික අවපාතයක් හෙවත් පරිහානියක් ලෙස සැලකේ. ආර්ථික පසුබැසිමක් කෙටි කාලයක් තුළ සිදු විය හැකි වුවද ආර්ථික ප්‍රසාරණයක් සඳහා දිගු කාලයක් ගත වේ.


JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

ව්‍යාපාර චක්‍රය තුළ විවිධ වූ අවධි හතරක් දැක ගත හැක. ඒවා නම්,

- ❖ ....................................................
- ❖ ....................................................
- ❖ ....................................................
- ❖ ....................................................

මූර්ත දළ දේශීය නිෂ්පාදිතය පහළ වැටෙන කාලපරිච්ඡේදය පසු බැසීමේ අවධිය ලෙස සැලකෙන අතර මෙම කාලච්ඡේදය තුළදී නිෂ්පාදනය මෙන්ම සේවා නියුක්තිය ද පහත වැටේ. ආර්ථික පසු බැසීමේ අවධිය අවසන් වී නැවත ප්‍රසාරණ අවධිය ආරම්භ වන්නේ පතුළ ලෙස හැඳින්වෙන අවධියේදී ය. පසු බැසීමේ පහළම අවස්ථාව ලෙස පතුළ හැඳින්වේ. ප්‍රසාරණ අවධියේ ඉහළම අවස්ථාව මුදුණත වන අතර ආර්ථික ක්‍රියාවලියේ පතුළ සිට මුදුණත දක්වා ගමන් කරන කාලය ප්‍රසාරණ අවධිය ලෙස හඳුන්වනු ලැබේ.

ආර්ථිකය සතු සම්පත් සම්භාරයත්, ඒවායේ ඵලදායිතාවත් මත විභව නිමවුම තීරණය කෙරේ. විභව නිමවුම් මට්ටම තුළින් පෙන්නුම් කරනුයේ ආර්ථිකයේ දිගු කාලීන ආර්ථික වෘද්ධියේ හැසිරීම ය. විභව නිෂ්පාදන මට්ටම යනු ආර්ථිකයේ සියලුම නිෂ්පාදන සම්පත් පූර්ණ හා උපරිම කාර්යක්ෂමතාවයකින් යුක්තව උපයෝජනය කරන විට බිහි වන මූර්ත දළ දේශීය නිෂ්පාදිතයයි. එනම් ආර්ථිකයේ උපරිම නිමවුම් මට්ටම විභව නිමවුම මගින් පෙන්නුම් කෙරේ.

සැබෑ නිමවුමත් විභව නිමවුමත් අතර වෙනස හෙවත් අඩු වැඩි වීම නිමවුම් පරතරය ලෙස හැඳින්වේ. ආර්ථිකයේ නිමවුම් පරතරය අඩු කරමින් විභව නිමවුම් මට්ටමට ළඟා කරවීම ආර්ථික ස්ථායිකරණය වන අතර ඒ සඳහා භාවිත කරන ආර්ථික ප්‍රතිපත්ති සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ලෙස හැඳින්වේ .

- ➢ ජාතික ආදායමේ වෘතාකාර ප්‍රවාහය

ආර්ථික පද්ධතියක් තුළ පවතින සාර්ව ආර්ථික කාරක අතර පවත්නා ජාතික ආදායම් ප්‍රවාහයන්ගේ වටිනාකම් ජාතික ගිණුම් තුළින් දැක්වේ. එම ක්‍රියාවලිය රූප සටහනකින් දැක්වීම ජාතික ආදායමේ වෘත්තාකාර ප්‍රවාහය ලෙස හැඳින්වේ. ආර්ථිකයක් ක්‍රියාත්මක වන ආකාරය අනුව ප්‍රධාන ආකෘති 3 කි.


JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

- ❖ ............................................................ (Simple Economy)
- ❖ ............................................................ (Closed Economy)
- ❖ ............................................................ (Open Economy)

මෙම ආර්ථිකයන් තුළ ක්‍රියාත්මක වන චක්‍රීය ප්‍රවාහය තුළ ආර්ථිකයේ පවත්නා සමස්ත නිමවුම, ආදායම හා වියදම පෙන්නුම් කෙරේ. එහිදී බාහිර ප්‍රවාහයෙන් පෙන්නුම් කරනුයේ රටක සමස්ත නිමවුම මිලදී ගැනීම සඳහා කුටුම්භයන් විසින් වැය කරන වියදම් ප්‍රවාහයන් වේ. අභ්‍යන්තර ප්‍රවාහය තුළින් පෙන්නුම් කරනුයේ නිෂ්පාදකයන් විසින් භාණ්ඩ හා සේවා විකිණීම තුළින් උපයා ගන්නා මුදල් නිෂ්පාදන සාධක හිමියන් වන කුටුම්භයන් වෙත බෙදී යන ආකාරයයි. ඒ අනුව අභ්‍යන්තර ප්‍රවාහය මූර්ත ප්‍රවාහයක් වන අතර බාහිර ප්‍රවාහය මූල්‍ය ප්‍රවාහයක් වේ.

- සරල / ආවෘත ආර්ථිකය (Simple Economy)

සරල ආර්ථික ය ප්‍රවාහ දෙකක් යටතේ ක්‍රියාත්මක වේ. එනම්, කුටුම්භ අංශයත්, ව්‍යාපාරික අංශයත් සරල ආර්ථික ය තුළ ක්‍රියාත්මක වේ.

සරල ආර්ථික ය තුළ කුටුම්භ අංශය සතු තම නිෂ්පාදන සාධක මුළුමනින්ම නිෂ්පාදන අංශයට සපයමින් එයින් ලබන ආදායම සම්පූර්ණයෙන්ම පරිභෝජනයට යොදවයි. මෙම ආර්ථිකය තුළ ආයෝජනයක්, ඉතිරි කිරීමක් හා ප්‍රාග්ධන භාණ්ඩ නිපදවීමක් සිදු නොකෙරේ.

JMC vLearning
"your virtual learning partner"


JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

තමන් සතු සාධක සේවා කුටුම්භයන් විසින් නිෂ්පාදන අංශයට සැපයීම සිදු කරයි. ඒ තුළින් මූර්ත ප්‍රවාහයක් බිහිවන අතර නිෂ්පාදන අංශ විසින් එම සාධක සේවා ලබාගැනීම වෙනුවෙන් කුටුම්බයන්ට ගෙවීම් කිරීම තුලින් මුල්‍ය ප්‍රවාහයක් බිහි කරයි. එමෙන්ම එම සාධක සේවා උපයෝගී කරගෙන නිපද වූ භාණ්ඩ හා සේවා කුටුම්භ අංශයට අලෙවි කිරීම තුළින් මූර්ත ප්‍රවාහයක් බිහි කරයි. කුටුම්භ අංශය විසින් තම සාධක ආදායම් උපයෝගී කරගෙන නිපද වූ භාණ්ඩ හා සේවා මිලදී ගැනීම තුළින් මුල්‍ය ප්‍රවාහයක් බිහිවේ. ආර්ථික යක මුළු ආදායම මුළු වියදමට සමාන වන අවස්ථාව සමතුලිත වන අවස්ථාව ලෙස සැලකේ.

ගිලිහීම්/ කාන්දුවීම්

ආර්ථික යක කුටුම්භ අංශය සතු ආදායම් සියල්ලම ව්‍යාපාරික අංශය වෙත ගලා යාමක් සිදු නොවේ. එම ආදායමින් කොටසක් විවිධ අරමුණු සඳහා වැය කරන බැවින් ඒවා ගිලිහීම් ලෙස හඳුන්වයි. මෙම ගිලිහීම් ජාතික ආදායම කෙරෙහි සංකෝචනාත්මක බලපෑමක් ඇති කරයි.

- ....................................
- ....................................

විදීම්/ එකතුවීම්

කුටුම්භ අංශය වෙතින් ව්‍යාපාරික අංශය වෙත ගලා යන අරමුදල්වලට අමතරව පිටතින් එකතු වන
දේ විදීම් ලෙස හැඳින්වේ. මෙසේ හඳුන්වන විදීම් මගින් ජාතික ආදායම කෙරෙහි ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති කරයි.

- .........................................
- .........................................
- .........................................

සාර්ව ආර්ථික යක ප්‍රධාන අංශ හතර

ආර්ථික ක්‍රියාවලියට දායක වන ප්‍රධාන ක්‍රියාකාරී ඒකක 04 ක් හඳුනා ගත හැකිය.

1) .......................................
2) .......................................
3) .......................................
4) .......................................


JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972
JMC vLearning "your virtual learning partner"

ආර්ථික කාරක අතර ගනුදෙනු සිදු වන ප්‍රධාන වෙළෙඳපොළ වර්ග

❖ සාධක සේවා වෙළඳපොළ

භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය වන නිෂ්පාදන සාධක මිලදී ගැනීම සිදු කරන වෙළෙඳපොළ සාධක සේවා වෙළෙඳපොළ ලෙස හැඳින්වේ. නිෂ්පාදන සාධක සපයනු ලබන්නේ ................................. වන අතර ඒ සඳහා ලබන ඉපයීම සාධක ආදායම ලෙස හඳුන්වයි.

❖ භාණ්ඩ හා සේවා වෙළඳපොළ

රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ව්‍යාපාර ආයතන විසින් කුටුම්භයන් වෙතින් ලබා ගත් සාධක යොදා ගනිමින් භාණ්ඩ හා සේවා නිෂ්පාදන කාර්යයේ නිරත වේ. එලෙස නිෂ්පාදනය කෙරෙන භාණ්ඩ හා සේවා විකුණන වෙළෙඳපොළ භාණ්ඩ හා සේවා වෙළෙඳපොළ ලෙස හඳුන්වයි.

➢ ජාතික ආදායම් ගිණුම්කරණය

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

එනම්, යයි යම් කාලපරිච්ඡේදයක් තුළ දේශීය ආර්ථිකයේ සියලුම ආයතනික ඒකකයන්ගේ කාර්ය සාධනය, ආර්ථික හැසිරීම හා එහි ව්‍යුහයත්, ආර්ථික ප්‍රවාහයන්ගේ වටිනාකමත් ඇස්තමේන්තු කිරීම ජාතික ගිණුම් සැකසීම ලෙස හැඳින්වේ.

ආයතනික ඒකක

වත්කම් හිමිකර ගැනීම, වගකීම් දැරීම, ආර්ථික ක්‍රියාකාරකම්වල නිරත වීම සහ සෙසු ඒකක සමග සම්බන්ධ වීමට හැකියාව ඇති ආර්ථික ඒකකයක් ආයතනික ඒකකයක් ලෙස හඳුන්වනු ලැබේ.


JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

ආර්ථික ප්‍රදේශයක් තුළ ක්‍රියාත්මක වන ආයතනික ඒකක පහත දැක්වේ.

- මූල්‍ය නොවන සමාගමික අංශය - NFC

වෙළෙඳපොළ අරමුණු කොට භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේ නිරත වන සංස්ථා මීට ඇතුළත් වේ. පෞද්ගලික හා රාජ්‍ය යන දෙඅංශයේම කර්මාන්තශාලා, නිෂ්පාදන ආයතන හා සේවා මීට ඇතුළත් වේ.

- මූල්‍ය සමාගමික අංශය (Financial Corporation sector) - FC

වෙළෙඳපොළ අරමුණු කොට මූල්‍ය සේවා සපයන සංස්ථා මීට ඇතුළත් වන අතර රාජ්‍ය හා පෞද්ගලික යන අංශ දෙකම මීට ඇතුළත් වේ. කල්බදු, බැංකු, රක්ෂණ, මූල්‍ය ක්ෂේත්‍රවල නිරත ආයතන මෙම අංශයට අදාළ නිදසුන් ලෙස දැක්විය හැක.

- රාජ්‍ය අංශය (General Government) - GG

වෙළෙඳපොළ අරමුණු කර නොගත් පෞද්ගලික හා සාමූහික පරිභෝජනය සඳහා සේවා සපයන විවිධ රාජ්‍ය ආයතන මීට ඇතුළත් වේ. සෞඛ්‍ය, අධ්‍යාපනය, ආරක්ෂාව, පරිසරය සුරැකීම වැනි සේවා උදාහරණ ලෙස දැක්විය හැක.

- ලාභ අපේක්ෂක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවා සපයන අංශය (Non-Profit Institutions Serving Household Sector) - NPISIH

වෙළෙඳපොළ නොවන භාණ්ඩ හා සේවා නිපදවා ගෘහ ඒකකවලට නොමිලේ හෝ වෙළෙඳපොළ මිලට වඩා අඩුවෙන් මෙම අංශය විසින් සපයනු ලැබේ. පුණ්‍යායතන, ආගමික සංවිධාන, වෘත්තීය සමිති, දේශපාලන පක්ෂ, අවමංගල්‍යාධාර සමිති උදාහරණ ලෙස දැක්විය හැක.

- ගෘහ ඒකක / කුටුම්භ අංශ (Household Sector) - HH

පාරිභෝගික හා නිෂ්පාදන යන දෙපිරිසම ගෘහ ඒකක අංශයේ සිටිති. තමන්ගේ පරිභෝජනය සඳහා භාණ්ඩ නිපදවා ගන්නා ගෘහ ඒකක දක්නට ලැබෙන අතර වෙළෙඳපොළ අරමුණු කොට නිෂ්පාදන කටයුතුවල නිරත ගෘහ ඒකක ද සිටී. සිරගත පිරිස් සහ ආගමික පූජක පක්ෂය ද මෙහි සිටී.

- නේවාසික නොවන කුටුම්භ සමාගමික අංශය -අවශේෂ ලෝකය (ROW)

## ආර්ථික ප්‍රදේශ

සඵල ආර්ථික පාලනයක් සහිත තනි ආණ්ඩුවක් යටතේ පුද්ගලයන්ට, භාණ්ඩවලට සහ ප්‍රාග්ධනයට නිදහසේ සංචලනය විය හැකි භූගෝලීය ප්‍රදේශය ආර්ථික ප්‍රදේශය ලෙස හැඳින්වේ. එම ආර්ථික ප්‍රදේශය තුළ වසරකට වැඩි කාලයක් නේවාසිකව සිටින ව්‍යවසායක ඒකක විසින් බිහි කරනු ලබන නිෂ්පාදනයේ වටිනාකම දේශීය නිෂ්පාදිතය (Domestic Production) ලෙස හඳුන්වනු ලැබේ. සියලුම නේවාසික, ආයතනික ඒකකයන්ගේ ආදායම, ජාතික ආදායම ලෙස හඳුන්වනු ලැබේ.


JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

ශ්‍රී ලංකාවේ ආර්ථික කලාපය ප්‍රධාන ඒකක තුනකින් සමන්විත වේ.

- ශ්‍රී ලංකා භූගෝලීය දේශ සීමාව තුළ පිහිටි සියලු නේවාසික ඒකක
- ලෝකයේ විවිධ ස්ථානවල පිහිටි ශ්‍රී ලංකාවට අයත් තානාපති කාර්යාල යනාදිය
- ශ්‍රී ලංකාවට අයත් මුහුදු හා නැව් සීමා සහ ශ්‍රී ලංකාව විසින් මෙහෙයවන ගුවන් යානා, නැව් යනාදිය...

➢ නිෂ්පාදනය

ශ්‍රමය, ප්‍රාග්ධනය සහ අමුද්‍රව්‍ය යෙදවුම් වශයෙන් භාවිත කරමින් කිසියම් ආයතනික ඒකකයක පාලනයට යටත්ව භාණ්ඩ හා සේවා නිමවුම් වශයෙන් බිහි කෙරෙන ක්‍රියාකාරකමක් ආර්ථික නිෂ්පාදනයක් වශයෙන් නිර්වචනය කෙරේ.

නිෂ්පාදන ක්‍රියාකාරකමකට වගකියන සහ එමගින් බිහිවන නිමවුමට හිමිකම් කියනු ලබන ආයතනික ඒකකයක් තිබිය යුතුය. කිසිදු මිනිස් මැදිහත් වීමක් හෝ මග පෙන්වීමක් හෝ නොමැතිව ස්වභාවිකව ම සිදුවන නිෂ්පාදන එනම් , ස්වභාවිකව බිහිවන ගංගා, දියඇළි, වර්ෂා ජලය, වනාන්තරයක පිහිටි ගස් යනාදිය ආර්ථික නිෂ්පාදන ලෙස නොසැලකේ. නමුත් කිසියම් ජලාශයක මිනිසුන් විසින් හෝ ආයතනයක් මැදිහත් වීමෙන් මත්ස්‍යයන් බෝ කිරීම සිදු කරනු ලැබේ නම් එය ආර්ථික ක්‍රියාකාරකමක් ලෙස සැලකේ. මන්ද එම ක්‍රියාව මිනිස් පාලනය හා වගකීමකට යටත්ව සිදු වන හෙයිනි.

➢ නිෂ්පාදන ඉම

ජාතික ගිණුම්කරණයේදී ආර්ථික නිෂ්පාදන ක්‍රියාකාරකමක් හෙවත් ඵලදායී නිෂ්පාදන කටයුතු ලෙස සැලකෙන්නේ කවර ඒවාද යන්න හඳුනා ගැනීම හෙවත් ආර්ථික නිෂ්පාදන ක්‍රියාකාරකම් සහ ආර්ථික නොවන නිෂ්පාදන ක්‍රියාකාරකම් වෙන්කොට හඳුනා ගැනීම නිෂ්පාදන ඉම ලෙස සැලකේ.

තමන්ම පදිංචි වී සිටින නිවාසවලින් සැපයෙන සේවාවන්, වැටුප් ලබන ගෘහ සේවකයන් විසින් ඉටු කරනු ලබන සේවාවනුත් ආර්ථික නිෂ්පාදන ක්‍රියාකාරකම්වලට ඇතුළත් කෙරේ.


JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

ජාතික ගිණුම්කරණයේදී ආර්ථික ක්‍රියාකාරකම් ලෙස නිෂ්පාදන ඉම තුළට පහත දැක්වෙන නිෂ්පාදන ක්‍රියාකාරකම් ඇතුළත් කෙරේ.

- තමන් සතුව ඇති, තමන් පදිංචිව සිටින නිවාසවලින් ලබාදෙන නේවාසික සේවය
- වැටුප් ලබන සේවකයන් විසින් ඉටු කරනු ලබන ගෘහ සේවා සහ පෞද්ගලික සේවා
- තමන්ගේ අවසාන පරිභෝජනය සඳහා හෝ ප්‍රාග්ධන සම්පාදනය සඳහා හෝ නිෂ්පාදනය කොට ඒවායේ නිෂ්පාදකයන් විසින් තමන් වෙත රඳවා ගත් සියලුම භාණ්ඩ
- නිෂ්පාදනය කළ ආයතනය හැර සෙසු ආයතනික ඒකක සඳහා නිෂ්පාදනය කරන ලද සියලුම භාණ්ඩ හා සේවා

ගෘහ ඒකක තුළ සිදුවන පහත දැක්වෙන ක්‍රියාකාරකම් ආර්ථික ක්‍රියාකාරකම් ලෙස සැළකේ.

- තමගේ පරිභෝජනය සඳහා කෘෂි බෝග නිෂ්පාදනය, ඒවා ගබඩා කොට තබා ගැනීම, වනාන්තරවලින් ලබා ගන්නා ආහාර බෝග, පළතුරු රැස් කර ගැනීම, දර කැපීම සහ එකතු කිරීම, දඩයම් කිරීම සහ මසුන් අල්ලා ගැනීම
- කෘෂි නිෂ්පාදන සැකසීම, වී කොටා සහල් සකසා ගැනීම, පිටි කොටා ගැනීම, මස් මාළු කල් තබා ගැනීම සඳහා පිළියෙළ කිරීම, පළතුරු බෝතල් කිරීම සහ වියළා ගැනීම, කිරි මුදවාගැනීම, කුඩා විවීම, පැදුරු විවීම
- රෙදි විවීම, ඇදුම් මසා ගැනීම, වළං සාදා ගැනීම, ගෘහ භාණ්ඩ තනා ගැනීම
- ජලය සපයා ගැනීම

මෙලෙස ගෘහ ඒකක තුළ සිදුවන නිෂ්පාදන ක්‍රියාකාරකම් නිෂ්පාදන ඉමට ඇතුළත් කරගනු ලැබුවද ගෘහ ඒකකයේ සාමාජිකයන් විසින් තමන්ගේත්ම පෞද්ගලික පරිභෝජනය සඳහා ඉටු කරන ලබන සේවාවන් ආර්ථික නිෂ්පාදන ක්‍රියාවන් ලෙස නොසැලකේ. එයට උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

- තමන් පදිංචි නිවස පිරිසිදු කිරීම, අලංකාර කිරීම, නඩත්තු කිරීම සිදු කිරීම
- නිවසේ ඇති කල් පවතින භාණ්ඩ සහ උපකරණ පිරිසිදු කිරීම, පිළිසකර කිරිම
- ආහාර පිළියෙළ කිරීම සහ පිළිගැන්වීම
- දරුවන් රැකබලා ගැනීම, පුහුණු කිරීම සහ උපදෙස් දීම
- පවුලේ වියපත් සාමාජිකයන්, ආබාධිත අය සහ රෝගී අය රැක බලා ගැනීම
- නිවසේම සාමාජිකයන් සහ ඔවුන්ගේ බඩු භාණ්ඩ සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම



JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

➢ නිරීක්ෂණය නොකෙරෙන ආර්ථික (Unobserved Economy)

දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේදී නිත්‍යානුකූල නොවන ආර්ථික කටයුතු සහ සැඟවුණු ආර්ථික ක්‍රියා ද ඇතුළත් වේ.

➢ සැඟවුණු ආර්ථික ක්‍රියා

සැඟවුණු ආර්ථික ක්‍රියා යනු, විධිමත් ගණනය කිරීමකට පාත්‍ර නොවන නිත්‍යානුකූල ආර්ථික ක්‍රියාකාරකම් වේ. මෙම ආර්ථික ක්‍රියාකාරකම් බලධාරීන්ගෙන් වුවමනාවෙන්ම වසන් කොට තබා ගැනීමට උත්සාහ දරයි. එයට හේතු ලෙස පහත දෑ දැක්විය හැකිය.

- බදු ගෙවීමෙන් වැළකී සිටීම
- සමාජ ආරක්ෂණ දායක මුදල් ගෙවීමෙන් වැළකී සිටීම
- නීතිමය ප්‍රමිතීන් පිළිපැදීමෙන් වැළකී සිටීම. (අවම වැටුප් ගෙවීම, උපරිම වැඩ කාලය පිළිබඳ නීති, ආරක්ෂණ හා සනීපාරක්ෂණ වැනි දෑ)
- වෙනස් පරිපාලන රෙගුලාසි අනුගමනය කිරීමට ඇති අකමැත්ත (සංඛ්‍යා ලේඛන සැපයීම. ප්‍රශ්න මාලා සහ වෙනත් ආකෘති පත්‍ර පිරවීමට ඇති අකමැත්ත)

➢ නිත්‍යානුකූල නොවන ආර්ථික ක්‍රියා

නිත්‍යානුකූල නොවන ආර්ථික ක්‍රියා, ස්වරූප දෙකකින් සමන්විත වේ. එනම්.

- නීතියෙන් තහනම් කර ඇති භාණ්ඩ හා සේවා නිෂ්පාදනය හා බෙදා හැරීම (ගස් කපා විකිණීම, තහනම් භාණ්ඩ ප්‍රවාහනය, මත්ද්‍රව්‍ය හා මත්පැන් නිපදවීම හා බෙදාහැරීම. ගණිකා සේවය)

- නිත්‍යානුකූල භාණ්ඩ හා සේවා, හිමිකම් නොලත් පුද්ගලයින් විසින් නිෂ්පාදන කිරීම හා බෙදාහැරීම (වයිද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා නොගත් වයිද්‍ය සේවය, බලපත්‍ර නොමැතිව වාහන ධාවනය, බලපත්‍ර නොමැතිව වැලි ගොඩ දැමීම)

➢ දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් කරනු ලබන ඵලදායී ආර්ථික කටයුතු

- නිෂ්පාදනය කළ සියලුම භාණ්ඩ හා සේවා
- තමන්ගේ නිවසින් ලබා දෙන්නා වූ නේවාසික සේවය
- වැටුප් හෝ එවැනි වෙනත් ආකාරයේ ගෙවීමක් වෙනුවෙන් වැය කළ ශ්‍රමය
- තම පෞද්ගලික පරිභෝජනය සඳහා නිෂ්පාදනය කළ භාණ්ඩ
- ස්වේච්ඡා ශ්‍රමය භාවිතයෙන් නිෂ්පාදනය කළ භාණ්ඩ හා සේවා



JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

- දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් කරගනු නොලබන ඵලදායි ආර්ථික ක්‍රියා
  - ඉගෙනීම හා විවේකය
  - නොමිලේ ලැබෙන ස්වභාවික සම්පත් (භූමිය, ජලය, වාතය)
  - ගෙවීමකින් තොරව නිවාස තුළ ඉටු කරනු ලබන ගෘහ සේවය
  - මිනිස් ශ්‍රමයකින් තොරව වර්ධනය වන ස්වභාවික සම්පත් (වනාන්තර)
  - මිල වෙනස් වීම හෝ ස්වභාවික වර්ධනය මගින් සම්පත් වල සිදුවන වටිනාකම වෙනස් වීම

- දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් කරගනු නොලබන ඵලදායී නොවන ක්‍රියා
  - සංක්‍රාම ගනුදෙනු
  - මූල්‍ය පත්‍රිකා ආශ්‍රිත ගනුදෙනු
  - පාවිච්චි කළ භාණ්ඩ විකිණීම ආශ්‍රිත ගනුදෙනු

- ජාතික ගිණුම් සැකසීමේ වැදගත්කම

  - ආර්ථික යේ කාර්ය සාධනය ඇගයිය හැකි වීම
  - ජාත්‍යන්තර සැසඳීම් සඳහා උපකාරී වීම
  - ආර්ථික වෘද්ධිය මැනිය හැකි වීම
  - ආර්ථිකයේ ව්‍යුහමය ලක්ෂණ අනාවරණය කළ හැකි වීම
  - ඒක පුද්ගල ජාතික නිෂ්පාදිතය ඇස්තමේන්තු කළ හැකි වීම
  - සම්පත් සංයුතිය හා උපයෝජනය අනාවරණය වීම
  - සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ හැසිරීම පුරෝකථනය කිරීම
  - ආර්ථික කාරක අතර ශ්‍රිතාත්මක සම්බන්ධතා හඳුනා ගැනීම

- ජාතික ගිණුම් දත්තවල පවත්නා සීමා

  - නොවිධිමත් ආර්ථිකය තුළ සිදුවන ඵලදායී නිෂ්පාදන ඇතුළත් නොවීම
  - යැපුම් ආර්ථික කටයුතු ජාතික නිෂ්පාදිතයට ඇතුළත් නොවීම
  - ගෘහනියන්ගේ සේවය ජාතික නිෂ්පාදිතයට ඇතුළත් නොවීම
  - රාජ්‍ය ණය පොළී ජාතික නිෂ්පාදිතය ගණනය කිරීමට දායක කර නොගැනීම
  - නිෂ්පාදනය නිසා පරිසරයට සිදුවන හානිය සැලකිල්ලට නොගැනීම
  - රාජ්‍ය සේවාවල ඵලදායීතාවේ ඇති වන වෙනස් වීම සලකා නොලැබීම
  - යුද හා ආරක්ෂණ කටයුතු සඳහා දරන වියදම් ඵලදායි නිෂ්පාදනයක් ලෙස සැලකීම
  - කල් පවත්නා ඇතැම් පාරිභෝගික භාණ්ඩ ආයෝජනයක් ලෙස සලකා ජාතික නිෂ්පාදිතයට ඇතුළත් නොකිරීම


JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

## ජාතික ආදායම් ගිණුම්කරණයට ඇති විවිධ ප්‍රවේශ

රටක නිෂ්පාදිතයේ අගය මැනීම සඳහා ප්‍රවේශ තුනක් උපයෝගී කර ගත හැක.

1. ..................................................
2. ..................................................
3. ..................................................

මෙම ආකාර තුනෙන්ම ගණනය කිරීම තුළින් ලැබෙන ජාතික නිෂ්පාදිතයේ අගය සමාන අගයක් වේ. එනම්, ආර්ථිකයේ සමස්ත නිෂ්පාදනය, එය බිහි කිරීමට දැරූ වියදමටත්, ඒ තුළින් ඉපයූ ආදායමටත් සමාන වන බවයි. ඒ අනුව ජාතික වියදමත්, ජාතික ආදායමත් අතර සාර්ව සාම්‍ය සම්බන්ධතාවයක් පවතී.

### 1. නිෂ්පාදන ප්‍රවේශය

කිසියම් ආර්ථිකයක, කිසියම් කාලපරිච්ඡේදයක් ඇතුළත, නිෂ්පාදනය කරන ලද සියලුම අවසාන නිෂ්පාදිතයන්ගේ වටිනාකම ගණනය කිරීම දළ දේශීය නිෂ්පාදිතය වන අතර මෙම ප්‍රවේශය තුළින් එහි අගය ගණනය කිරීම සිදු කෙරේ. මෙම වටිනාකම ඇස්තමේන්තු කිරීම සඳහා භාවිත කළ හැකි ප්‍රවේශ දෙකකි.

1. ..................................................
2. ..................................................

➢ අවසාන නිෂ්පාදිත ක්‍රමය

අවසාන නිෂ්පාදිත යනුවෙන් අදහස් වන්නේ තවදුරටත් සකස් කිරීමකින් තොරව පරිභෝජනයට හෝ ආයෝජනයට යොදා ගත හැකි භාණ්ඩය. එනම්, ලී පුටුවක් නිර්මාණය කිරීමේදී ලී කැපීම, ඔප මට්ටම් කිරීම, පුටුවක් නිෂ්පාදනය කිරීම සිදු කෙරේ. එහිදී අවසාන නිෂ්පාදිතය වනුයේ පුටුවයි. ඒ අනුව අවසාන නිෂ්පාදිත ක්‍රමය අනුව ජාතික නිෂ්පාදිතය ලෙස ඇස්තමේන්තු කරනුයේ පුටුව වන අවසාන නිෂ්පාදිතයේ අගයයි. එසේ සිදු කරනු ලබන්නේ බහු ගණන දෝෂවලින් වැළකීම සඳහාය.

බහු ගණන දෝෂ ලෙස අදහස් කරනුයේ එකම භාණ්ඩයක අගය කිහිප වාරයක් නිෂ්පාදිතයේ අගයට එකතු වීමේ දෝෂය වේ. ඒ තුළින් නිෂ්පාදනයේ අගය අධි තක්සේරු වීමකට ලක් වේ.


JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

අවසාන නිෂ්පාදිත ක්‍රමය යටතේ ජාතික නිෂ්පාදිතය මැනීම ප්‍රායෝගික වූ ක්‍රමවේදයක් වුව ද, යම් යම් සැළකිය යුතු දුෂ්කරතා එහි පවතී.

- භාණ්ඩයක් අවසාන භාණ්ඩයක් වන්නේ ද, අන්තර් භාණ්ඩයක් වන්නේ ද, යන්න තීරණය වනුයේ එහි භාවිතය මතයි. ව්‍යාපාරිකයෙක් මෝටර් රථයක් නිපදවීම සඳහා මිලට ගන්නා ටයර් අන්තර් භාණ්ඩයකි. නමුත්, පාරිභෝගිකයෙකු විසින් තම මෝටර් රථය සඳහා මිලට ගන්නා ටයර් පාරිභෝගික භාණ්ඩයකි. නිවසේ පරිභෝජනය සඳහා මිලට ගන්නා ලද එළකිරි අවසාන නිෂ්පාදිතයකි. නමුත්, බටර් නිපදවන කර්මාන්තයකදී බටර් නිපදවීම සඳහා එළකිරි අන්තර් භාණ්ඩයක් ලෙස උපයෝගී කර ගැනේ.

- භාණ්ඩ මිලදී ගන්නේ කුමන පරමාර්ථයකින් ද යන්න හඳුනා ගැනීම ප්‍රායෝගිකව දුෂ්කර වීම.

➢ එකතු කළ වටිනාකම් ක්‍රමය

අවසාන නිමවුම් ක්‍රමයේ පවතින ගැටලු තත්වයන් මගහරවන නිමවුම් තක්සේරු කිරිමේ වඩාත් සුදුසුම ක්‍රමය වන්නේ එකතු කළ වටිනාකම් ක්‍රමය යි.

නිෂ්පාදනය කරන ලද භාණ්ඩ හා සේවා වල මූල්‍යමය වටිනාකම නිමවුමේ දළ වටිනාකම ලෙස හඳුන්වයි. නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා පිටතින් මිල දී ගනු ලබන භාණ්ඩ හා සේවා අතරමැදි යෙදවුම් ලෙස හඳුන්වන අතර භාණ්ඩ හා සේවා නිමවුමේ දළ වටිනාකමින් අතරමැදි යෙදවුම්වල වටිනාකම අඩු කළ විට ලැබෙන අගය නිෂ්පාදිතයේ එකතු කළ වටිනාකම ලෙස හඳුන්වනු ලබයි.

දළ එකතු කළ අගය (Gross value Added-GVA)

නිමවුමේ දළ වටිනාකමෙන් අතරමැදි යෙදවුම්වල වටිනාකම හෙවත් අතරමැදි පරිභෝජනය අඩු කළ විට ශේෂ වන අගය දළ එකතු කළ අගය නම් වේ. එනම්,

දළ එකතු කළ අගය යනු නිෂ්පාදිත ක්‍රියාවලියේදී අලුතින් ජනනය කෙරෙන වටිනාකමයි. නිමවුමේ වටිනාකම යනු නිෂ්පාදකයන් විසින් අලුතින් ජනනය කළ වටිනාකම නොවේ. ඒ තුළ පිටතින් මිලදී ගත් අතරමැදි යෙදවුම්වල වටිනාකම ද අන්තර්ගත වී ඇත. මේ අනුව එකතු කළ අගය ලබා ගැනීම සඳහා නිමවුමේ දළ වටිනාකමෙන් අතරමැදි යෙදවුම් වටිනාකම ඉවත් කළ යුතු වේ. ආර්ථික ප්‍රදේශය තුළ සීමිත සියලුම ව්‍යවසායකයන්ගේ එකතු කළ අගයන්ගේ ඓක්‍යය, සමස්ත ආර්ථිකය නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ හා සේවාවල වටිනාකම වේ.

JMCvLearning
"your virtual learning partner"


JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

නිෂ්පාදන ක්‍රියාවලිය තුළ එකතු කළ අගය ක්‍රම දෙකකට ගණනය කළ හැකිය.

- නිෂ්පාදන මූලාශ්‍රය පදනම් කර ගැනීම තුළින් එකතු කළ අගය ගණනය කිරීම
- ආදායම් මූලාශ්‍රය පදනම් කර ගැනීම තුළින් එකතු කළ අගය ගණනය කිරීම

## නිෂ්පාදන මූලාශ්‍රය පදනම් කරගෙන එකතු කළ අගය ගණනය කිරීම

නිෂ්පාදන ක්‍රියාවලිය මගින් බිහිවන භාණ්ඩ හා සේවා නිමවුම (Output) ලෙස අදහස් කෙරේ. නිෂ්පාදනය කරන ලද භාණ්ඩ හා සේවාවල මූල්‍යමය වටිනාකම නිමවුමේ දළ වටිනාකම (Gross value of output-GVO) ලෙස හඳුන්වනු ලැබේ. සමස්ත ආර්ථිකයේම නිෂ්පාදිතයේ එකතු කළ අගය දළ දේශීය නිෂ්පාදිතය තුළින් පෙන්නුම් කෙරේ. නිෂ්පාදන ක්‍රියාවලිය තුළ යෙදවුම් වර්ග දෙකක් දක්නට ලැබේ. ඒවා නම්,

- ප්‍රාථමික යෙදවුම්
- අතරමැදි යෙදවුම්

ප්‍රාථමික යෙදවුම් යනු නිෂ්පාදන ක්‍රියාවලිය තුළ යොදා ගැනෙන නිෂ්පාදන සාධක වේ. එනම් භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය යනාදියයි. එකතු කළ අගය ජනනය කෙරෙන යෙදවුම් ලෙස ද මේවා සැලකේ.

නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා පිටතින් මිලදී ගනු ලබන භාණ්ඩ හා සේවා අතරමැදි යෙදවුම් (Intermediate Inputs) ලෙස හඳුන්වනු ලැබේ. නිෂ්පාදන ක්‍රියාවලිය තුළ භාවිත කළ පසු අවසාන වන විදුලිය, ජලය, අමුද්‍රව්‍ය, ලිපිද්‍රව්‍ය, උපදේශක සේවා යනාදිය අතරමැදි යෙදවුම් ලෙස සැලකේ. නිෂ්පාදන ක්‍රියාවලියට මෙම යෙදවුම් යොදා ගැනීම අතරමැදි පරිභෝජනය (Intermediate Consumption-IC) ලෙස නම් කෙරේ.

නිෂ්පාදන මූලාශ්‍රයට අනුව එකතු කළ අගය ගණනය කරනුයේ නිමවු මේ වටිනාකමින් පිටතින් ලබා ගත් සියලුම යෙදවුම්වල වටිනාකම අඩු කිරීමෙනි

උදා - නිමවුමෙහි වටිනාකම 1950

අමුද්‍රව්‍ය 500

අනෙකුත් ඇසුරුම් ද්‍රව්‍ය හා සේවා පිරිවැය 250

- ආදායම් මූලාශ්‍රය පදනම් කරගෙන එකතු කළ අගය ගණනය කිරීම

ආදායම් මූලාශ්‍රය යටතේ එකතු කළ අගය ගණනය කරනුයේ නිෂ්පාදන ක්‍රියාවලියට සහභාගි වන සියලුම නිෂ්පාදන සාධකවලට ලැබෙන ආදායම් සහ ස්ථාවර ප්‍රාග්ධනය උපයෝජනය කිරීමෙන් හටගන්නා ක්ෂයවීම් එකතු කිරීමෙනි.


JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

නිමවුම් ප්‍රවේශය යටතේ එකතු කළ වටිනාකම

2. ආදායම් ප්‍රවේශය

නිෂ්පාදන ක්‍රියාවලියක් තුළදී එයට අදාළ කර ගත් සියලුම නිෂ්පාදන සාධක සඳහා කරනු ලබන ගෙවීම හෙවත් සාධක ඉපයීම් පදනම් කරගෙන නිෂ්පාදිතයේ වටිනාකම ගණනය කිරීම ආදායම් ප්‍රවේශය තුළින් සිදු කෙරේ.

නිෂ්පාදන ක්‍රියාවලිය තුළ බිහිවන ආදායම් ස්වරූප කිහිපයකි. එම ආදායම් ස්වරූප ප්‍රාථමික ආදායම් ලෙස හඳුන්වනු ලැබේ. ප්‍රාථමික ආදායම යනු නිෂ්පාදන ක්‍රියාවලියේ නියුතු වීමේ ප්‍රතිඵලයක් ලෙස හෝ නිෂ්පාදනයට අවශ්‍ය කරන වත්කම් හිමිකර ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස ආයතනික ඒකකවලට ලැබෙන ආදායමයි. ප්‍රාථමික ආදායමේ අන්තර්ගතයන් වනුයේ,

1. ...................................................
2. ...................................................
3. ...................................................
4. ...................................................

නිෂ්පාදන ක්‍රියාවලියක් නිසා ජනනය කෙරෙන මෙම ආදායම් සමූහය නිෂ්පාදනයේ දළ එකතු කළ අගය (GVA)ට සමාන වේ.

ආදායම ප්‍රවේශය යටතේ දළ එකතු කළ අගය = {CE + OS +MI+ (t-s)}



JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972
JMC vLearning "your virtual learning partner"

➢ සේවක ආදායම

නිෂ්පාදන ක්‍රියාවලියට දායක වීම තුළින් සේවකයෙකුට නිෂ්පාදන ඒකකයකින් හිමිවන සියලුම ආදායම් වල සමස්තය සේවක ආදායම් ලෙස සැළකේ. ඒ තුළට පහත දැක්වෙන සංරචකයන් අන්තර්ගත වේ.

- වැටුප් හා වේතන
- සේවායෝජකයා විසින් ලබා දෙන සමාජ ආරක්‍ෂණ දායක මුදල්
- රෝගී තත්ත්වයකදී, විරැකියා අවස්ථාවක දී හා විශ්‍රාම ගන්නා විටදී සේවායෝජකයා විසින් සෘජුවම සේවකයාට ලබා දෙන අරමුදල්

➢ මෙහෙයුම් අතිරික්තය

මෙහෙයුම් අතිරික්තය ලෙස අදහස් කරනුයේ සමාගමික අංශය ජනනය කෙරෙන ආදායම යි. මෙය බදු කුලී, පොළිය සහ දළ ලාභය යන දේපොළ ආදායම් යන සාධකවලින් සමන්විත වේ. එනම්,

- මුල්‍ය වත්කම් ණයට ලබා දුන් ණයහිමියන්ට ගෙවිය යුතු පොළිය
- කොටස් හිමියන්ට ගෙවිය යුතු ලාභ සහ නොබෙදූ ලාභ
- භූමිය සහ ඛණිජ සම්පත් වැනි නිෂ්පාදනය නොකළ වත්කම් හිමිකරුවන් වෙත ගෙවිය යුතු බදු කුලී

➢ මිශ්‍ර ආදායම

ගෘහ ඒකක විසින් හිමිකරගෙන සිටින හෝ හවුල් ව්‍යාපාර වශයෙන් පවත්වාගෙන යනු ලබන හෝ  සමාගමික නොවන ව්‍යවසායන් ජනනය කෙරෙන ආදායම මිශ්‍ර ආදායම ලෙස සැලකේ. පවුලේ සාමාජිකයන් මෙවැනි වූ ව්‍යාපාර තුළ වැටුප් නොලබා සේවය කරන බැවින් මෙම ව්‍යාපාරවල ඉපයීම් වලින් කොටසක් සේවක ආදායම් ලෙස නිරූපණය කෙරෙන අතර තවත් කොටසක් මෙහෙයුම් අතිරික්තය ලෙස නිරූපණය කෙරේ.

ගෘහ ඒකක විසින් පවත්වාගෙන යනු ලබන මෙවැනි ව්‍යවසායයන්ගේ ඉපයීම්වලින් අතරමැදි පරිභෝජනය, සියලුම ශුද්ධ බදු සහ වැටුප් ලබන සේවකයන්ගේ ගෙවීම් අඩු කළ ඉතිරි වන ප්‍රමාණය මිශ්‍ර ආදායම ලෙස සැලකේ.

➢ නිෂ්පාදනය මත සහනාධාර අඩු කළ පසු වෙනත් බදු

ආණ්ඩුවේ ප්‍රාථමික ආදායම ලෙස නිෂ්පාදනය සහ ආනයන මත ශුද්ධ බදු මෙන්ම නිෂ්පාදනය හා ආනයන මත ලබා දෙන සහනාධාර සැලකේ. ආදායම සහ ධනය මත රජය විසින් අය කරනු ලබන බදු මීට ඇතුළත් නොකෙරේ.

- මේ අනුව ආදායම් ප්‍රවේශය යටතේ මූලික මිලට දළ එකතු කළ අගය, පහත දැක්වේ.


JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

## දළ දේශීය ආදායම සහ දළ ජාතික ආදායම

ඉහත සඳහන් කළ පරිදි ප්‍රාථමික ආදායම් සියල්ලෙහිම එකතුව දළ දේශීය ආදායම ලෙස හඳුන්වයි. ජාතික ආදායම යනු නේවාසිකයන් සතු නිෂ්පාදන සාධක විදේශ කටයුතුවල යෙදවීමෙන් ලබන ආදායම් සහ නිර්නේවාසිකයන් සතු නිෂ්පාදන සාධක දේශීය නිෂ්පාදන කටයුතු සඳහා යෙදවීම වෙනුවෙන් සිදු කරන ලද ගෙවීම් ගැළපීම තුළින් ලැබෙන අගයයි.

වැය කළ හැකි ආදායම් තුළින් නේවාසික ඒකකවල ක්‍රය ශක්තිය පෙන්නුම් කෙරේ. අනේවාසික ශ්‍රමිකයන්ගෙන් ලැබෙන ප්‍රේශණ, අනේවාසික රක්ෂණ සමාගම් විසින් ගෙවනු ලබන හිමිකම් වැනි දෑ සංක්‍රාම ලෙස සැලකේ. නමුත් මෙවැනි සංක්‍රාම ආදායම් ලෙස නොසැලකේ. එහෙත් මෙවන් සංක්‍රාම නේවාසිකයන්ගේ ක්‍රය ශක්තිය තීරණය වීමට බලපාන බැවින් වැය කළ හැකි ආදායම ගණනය කිරීමේදී සැලකිල්ලට ගැනේ. දළ ජාතික ආදායමට ශුද්ධ විදේශ සංක්‍රාම ගැළපූ විට වැය කළ හැකි දළ ජාතික ආදායම ලැබේ.

### කුටුම්භ ආදායම හා වැය කළ හැකි කුටුම්බ ආදායම

කුටුම්භ ආදායම යනු සාධක සේවා සැපයීම වෙනුවෙන් කුටුම්භයන්ට ලැබෙන ආදායමයි. මෙය පෞද්ගලික ආදායම ලෙස ද හඳුන්වනු ලැබේ. කුටුම්භ ආදායම ගණනය කරන ආකාරය පහත සූත්‍රය මගින් පෙන්වා දී ඇත.

**HI = GNI + HTr – GPI – D – PT – R - CS**


JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

HI = කුටුම්භ ආදායම

GNI = දළ ජාතික ආදායම

HTr = කුටුම්භවලට ලැබෙන සංක්‍රාම

GPI = රජයේ දේපළ ආදායම

D = ක්ෂය වීම්

PT = සමාගමික ලාභ බදු

R = රඳවාගත් ලාභ

CS = සමාජ සංරක්ෂණ ක්‍රමවලට ශ්‍රමිකයන්ගෙන් කෙරෙන දායක වීම

වැය කළ හැකි කුටුම්භ ආදායම යනු කුටුම්භවලට ලැබෙන ආදායමෙන් කුටුම්වලට වියදම් රම සඳහා යොදා ගත හැකි ආදායම යි. කුටුම්භ ආදායමෙන් කුටුම්භ ඍජු බදු අඩු කළ පසු වැය කළ හැකි කුටුම්භ ආදායම ලැබේ.

## 3. වියදම් ප්‍රවේශය

දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම එම නිෂ්පාදිතය මිලදී ගැනීම සඳහා දරනු ලබන වියදම හරහා ගණනය කිරීම වියදම් ප්‍රවේශය ඔස්සේ සාකච්ඡා කෙරේ.

- කුටුම්භ අංශය විසින් දරන පෞද්ගලික පරිභෝජන වියදම (C)
- ව්‍යාපාරික අංශය විසින් දරන දළ දේශීය පෞද්ගලික ආයෝජන වියදම (I)
- රාජ්‍ය අංශය විසින් භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට දරන වියදම (G)
- විදේශීය අංශය සමග වෙළෙඳාම තුළින් බිහිවන ශුද්ධ අපනයන (NX) (අපනයන-ආනයන)

ඒ අනුව වියදම් ප්‍රවේශය ඔස්සේ දළ දේශීය නිෂ්පාදිතය පහත පරිදි ගණනය කළ හැක.



JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

- පරිභෝජනය

කුටුම්භ අංශය විසින් තම වුවමනා ඉටු කර ගැනීම උදෙසා භාණ්ඩ හා සේවා භාවිත කිරීම පරිභෝජනය ලෙස අදහස් කෙරේ. පරිභෝජන වියදම රූප දෙකකින් දැක්විය හැකිය.

අවසාන පරිභෝජන වියදම (C + G)

කුටුම්භයන් විසින් තම පරිභෝජනය සඳහා භාණ්ඩ හා සේවා අත්පත් කරගැනීම උදෙසා දරණ වියදම අවසාන පරිභෝජන වියදම ලෙස අදහස් කෙරේ.

a. පෞද්ගලික පරිභෝජන වියදම (C) - කුටුම්භ පරිභෝජන වියදම සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවා සපයන අංශය කුටුම්භ සඳහා කරනු ලබන මිලදී ගැනීම්වල එකතුවෙන් පෞද්ගලික පරිභෝජන වියදම සමන්විත වේ.

   කුටුම්භයන් විසින් හෝ කුටුම්භයන් සඳහා හෝ භාණ්ඩ අත්පත් කර ගැනීම, කුටුම්භ විදේශ රටවලදී පරිභෝජනය සඳහා කරන වියදම් ද, පිටරටින් කුටුම්භවලට ලැබෙන ත්‍යාග යනාදිය පෞද්ගලික පරිභෝජන වියදමට ඇතුළත් කරන අතර භාවිත කළ භාණ්ඩ සඳහා කරන වියදම් පෞද්ගලික පරිභෝජන වියදමට ඇතුළත් නොකෙරේ.

b. රාජ්‍ය පරිභෝජන වියදම (G) - මධ්‍යම රජය සහ එහි උප ආයතන භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා දරණ වියදම රාජ්‍ය පරිභෝජන වියදම ලෙස හැඳින්වේ. රාජ්‍ය පරිභෝජන වියදම පුද්ගල පරිභෝජන වියදම ලෙසත්, සමූහ පරිභෝජන වියදම ලෙසත් වර්ග කළ හැකිය. අධ්‍යාපනය, සෞඛ්‍ය, සමාජ ආරක්ෂණ වියදම්, සුබසාධන වියදම් යනාදිය සඳහා රජය විසින් දරණ වියදම් පුද්ගල පරිභෝජන වියදම ලෙස සැලකෙන අතර රාජ්‍ය පරිපාලන වියදම්, දුම්රිය සහ මහාමාර්ග සඳහා දරණ වියදම්, ආරක්ෂණ වියදම් යනාදිය සමූහ පරිභෝජන වියදම් ලෙස සැලකේ.

♠ **Special Note**

සත්‍ය සුනිශ්චිත පරිභෝජන වියදම

සෑම විටම වියදම් දරන්නා සහ පරිභෝජනය කරන්නා එකම පුද්ගලයා නොවන බැවින් මුදල් වියදම් කරන්නේ කවරෙකුද යන්න පිළිබඳ නොසලකා, සැබවින්ම භාණ්ඩ හා සේවා අත්පත් කරගැනීම සඳහා දරණ වියදම සත්‍ය සුනිශ්චිත පරිභෝජන වියදම ලෙස අදහස් කෙරේ. පෞද්ගලික පරිභෝජන වියදමට රජයේ පුද්ගල පරිභෝජන වියදම එකතු කළ විට කුටුම්භයන්ගේ සත්‍ය සුනිශ්චිත පරිභෝජන වියදම ලබා ගත හැක.

JMC vLearning "your virtual learning partner"

➢ දළ ප්‍රාග්ධන සම්පාදනය (I)

දිගුකාලීනව නිෂ්පාදන ක්‍රියාවලියට දායක වන, වසරකට වැඩි කාලයක් භාවිත කළ හැකි භාණ්ඩ නිෂ්පාදනය කිරීම දළ ප්‍රාග්ධන සම්පාදනය ලෙස අදහස් කෙරේ. දළ ප්‍රාග්ධන සම්පාදනය ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ.

1. ....................................................
2. ....................................................
3. ....................................................

1. දළ ස්ථාවර ප්‍රාග්ධනය

වසරකට වැඩි කාලයක් නිෂ්පාදන ක්‍රියාවලියට දායක කර ගත හැකි භාණ්ඩ නිෂ්පාදනය කිරීම දළ ස්ථාවර ප්‍රාග්ධනය ලෙස හැඳින්වේ.

වසරකට අඩු කාලයක් ඇති ප්‍රාග්ධන භාණ්ඩ අතරමැදි පරිභෝජන භාණ්ඩ වලට ඇතුළත් කරන අතර සුළු වටිනාකමක් ඇති වසරකට වැඩි කාලයක් පවතින ස්ථාවර වත්කම් ද අතරමැදි භාණ්ඩ පරිභෝජන වියදම්වලට ඇතුළත් කෙරේ.

ස්ථාවර වත්කම් නැවතත් ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය වත්කම් වශයෙන් වර්ග කෙරේ. නිවාස, යන්ත්‍ර සූත්‍ර, ගොඩනැගිලි යනාදිය අස්පෘශ්‍ය වත්කම් ලෙස සැලකෙන අතර පරිගණක වැඩසටහන්, කීර්තිනාමය, වෙළෙඳනාම යනාදිය අස්පෘශ්‍ය වත්කම් ලෙස සැලකේ.

එමෙන්ම ස්ථාවර වත්කම් නැවතත් නිෂ්පාදනය කරන ලද මූල්‍ය නොවන වත්කම් ලෙසත්, නිෂ්පාදනය නොකරන ලද මූල්‍ය නොවන වත්කම් ලෙසත් වර්ග කළ හැකිය. නිෂ්පාදනය කරන ලද මූල්‍ය නොවන වත්කම් ලෙස නිවාස, වෙනත් ගොඩනැගිලි සහ ව්‍යුහයන්, යන්ත්‍ර සූත්‍ර, අවි ආයුධ, වගා කරන ලද වත්කම් ලෙස දැක්විය හැකි අතර නිෂ්පාදනය නොකළ මූල්‍ය නොවන වත්කම් ලෙස ස්වභාවික සම්පත්, ගිවිසුම්, බදුකර සහ බලපත්‍ර සහ සන්නම් යනාදිය දැක්විය හැකිය.

ප්‍රාග්ධන පරිභෝජන වියදම/ ක්ෂය ප්‍රතිසම්පාදනය

නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදා ගන්නා ප්‍රාග්ධන සම්පත්වල ආයු කාලය අවසාන වන විට එම ප්‍රාග්ධන සම්පත් යළි මිලට ගැනීම සඳහා වෙන් කරන වටිනාකම ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජන වියදම ලෙස සැලකේ.

2. තොග වෙනස් වීම්

තොග වෙනස් වීම ඇස්තමේන්තු කරනුයේ අවසන් තොග වටිනාකමින් ආරම්භක තොග වටිනාකම අඩු කිරීමෙනි. තොග කොටස් තුනකින් සමන්විත වේ.

- නොවිකිණු නිමි භාණ්ඩ තොග
- නිම කරමින් පවතින (අර්ධ නිමි) භාණ්ඩ තොග
- අමුද්‍රව්‍ය තොග

3. වටිනා දේ අත්පත් කර ගැනීම

රත්රන්, රිදී, මුතු, මැණික්, කෞතුක භාණ්ඩ වැනි වටිනා දෑ නිෂ්පාදන ක්‍රියාවලියට භාවිත නොකෙරේ. ඒවා පරිභෝජනයෙන් නිමාවට පත් නොවන බැවින් පරිභෝජන වියදම්වලට ඇතුළත් කිරීමක් සිදු නොකෙරේ. මෙවැනි භාණ්ඩ විනාශ වන්නේ ද නැත. මෙවැනි වටිනා දෑ පරිභෝජනය හෝ අතරමැදි භාණ්ඩ නොවන නිසා ප්‍රාග්ධන භාණ්ඩ ලෙස වර්ග කෙරේ. එම නිසා එවැනි වටිනා දෑ අත්පත් කරගැනීම සහ එම වටිනාකම් අත්හැරීම නිසා සිදු වන වටිනාකම්වල වෙනස්වීම් ප්‍රාග්ධන සම්පාදනයට ගළපනු ලබයි.

දළ දේශීය වියදම

දළ දේශීය වියදම සමන්විත වනුයේ පෞද්ගලික පරිභෝජන වියදම, රාජ්‍ය වියදම, දළ ආයෝජන වියදම යන වියදම් වර්ග තුනෙහි එකතුවෙනි. ක්ෂය වීම් ඉවත් කිරීමකින් තොරව දළ ආයෝජනය යොදාගෙන ඇති බැවින් දළ දේශීය වියදම ලෙස හඳුන්වයි. ආවෘත ආර්ථිකයක දළ දේශීය වියදම පහත අයුරින් ගණනය කළ හැක.

JMC Learning
"your virtual learning partner"

- පවත්නා වෙළඳපොළ මිල අනුව දළ ජාතික ආදායම (වියදම් ප්‍රවේශය)

වියදම් ප්‍රවේශය ඇසුරින් නිෂ්පාදිතය ඇස්තමේන්තු කිරීමේ ප්‍රයෝජන

- නිෂ්පාදිතය සමන්විත වන අංශයත් එය උපයෝජනය කරන අංශයත් අනාවරණය කර ගැනීමට පහසු වීම
- දළ දේශීය නිෂ්පාදිතයත්, දළ දේශීය වියදමත් අතර පරතරය ඇසුරින් ශුද්ධ අපනයන හඳුනාගත හැකි වීම
- ආයෝජන ද, ජාතික ඉතුරුද සම්බන්ධ තොරතුරු අනාවරණය වීම

දළ දේශීය වියදම හා දළ දේශීය නිෂ්පාදිතය

දළ දේශීය වියදමෙහි අගයත්, දළ දේශීය නිෂ්පාදිතයේ අගයත් අතර අඩු හෝ වැඩි වීමේ වෙනසට හේතු වන්නේ ශුද්ධ අපනයන හෙවත් භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂයේ බලපෑම මගිනි. ශුද්ධ අපනයනය සෘණ අගයක් ගන්නා අවස්ථාව හෙවත් ආනයන වියදම් අපනයන ආදායම ඉක්මවා යන අවස්ථාවේදී දළ දේශීය නිෂ්පාදිතයට වඩා දළ දේශීය වියදම ඉහළ අගයක් ගනී. අපනයන ආදායම, ආනයන වියදම ඉක්මවා යන විට (ශුද්ධ අපනයන ධන අගයක් ගන්නා විට) දළ දේශීය වියදම දළ දේශීය නිෂ්පාදිතයට වඩා පහළ අගයක් ගනී.

දළ දේශීය වියදම හා දල දේශීය නිෂ්පාදිතය අතර වෙනසින් දැක්වෙන්නේ,

.......................................................................................................................

JMC vLearning
"your virtual learning partner"

ජාතික ගිණුම් සැකසීමේ දී නව ක්‍රමවේදයට අනුව දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරනුයේ වෙළෙඳපොළ මිල යටතේ පමණි. ශුද්ධ දේශීය නිෂ්පාදිත ගණනය කරනු ලබන්නේ දළ දේශීය නිෂ්පාදිතයෙන් ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජන වියදම අඩු කිරීමෙනි.

ක්ෂය වීම් / ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය

නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යන්ත්‍ර සූත්‍ර, ගොඩනැගිලි උපකරණ වැනි ප්‍රාග්ධන සම්පත් යොදා ගන්නේ. එම නිසා එම ප්‍රාග්ධන තොගයේ වටිනාකම අඩු වේ. ව්‍යාපාර ගිණුම්කරණයේදී මෙය හඳුන්වන්නේ ක්ෂය වීම් (Depreciation) ලෙසයි. ජාතික ගිණුම්කරණයේදී ඒ සඳහා භාවිත කරන සංකල්පය වනුයේ ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය (Consumption of fixed Capital - CFC) ලෙසයි. කිසියම් නිෂ්පාදන ක්‍රියාකාරකමක් ආර්ථිකයේ නිෂ්පාදනයට කරනු ලබන ශුද්ධ දායකත්වය හුදෙක් නිමවුමේ වටිනාකම සහ අතරමැදි යෙදවුම්වල වටිනාකම අතර වෙනස් වන දළ එකතු කළ අගයෙන් පමණක් දැනගත නොහැකිය. ඒ අනුව ශුද්ධ එකතු කළ අගය ගණන කළ හැකි ආකාරය පහත දැන්වේ.

## ජාතික ගිණුම්කරණයේදී භාවිත වන මිලයන්

භාණ්ඩ නිෂ්පාදකයන් හා පාරිභෝගිකයන් මත පනවනු ලබන විවිධ බදු සහ ලබාදෙන සහනාධාර කරණ කොට එකම භාණ්ඩයක් පිළිබඳව මිල ප්‍රභේද තුනක් දක්නට ලැබේ.

- මූලික මිල
- නිෂ්පාදකයන්ගේ මිල
- ගැණුම්කරුවන්ගේ මිල

JMC vLearning "your virtual learning partner"

- මූලික මිල

නිෂ්පාදකයා තම භාණ්ඩය හෝ සේවාව හෝ නිෂ්පාදනය කොට අලෙවි කිරීමට සූදුසුකම් කොට ඇති අවස්ථාවකදී එම භාණ්ඩය හෝ සේවාව සඳහා අදාළ මිල මූලික මිල නම් වේ.

- නිෂ්පාදකයන්ගේ මිල

මූලික මිලට නිෂ්පාදකයා වෙත සෘජුවම පැවරූ නිෂ්පාදිත බදු එකතු කොට නිෂ්පාදකයාට ලබා දුන් සහනාධාර අඩු කිරීමෙන් පසු ලැබෙන අගය නිෂ්පාදකයගේ මිල ලෙස අදහස් කෙරේ.

- ගැණුම්කරුවන්ගේ මිල

පාරිභෝගිකයා සත්‍ය වශයෙන්ම භාණ්ඩ හෝ සේවා සඳහා ගෙවන මිල ගැණුම්කරුවන්ගේ මිල ලෙස හැඳින්වේ. නිෂ්පාදකයන්ගේ මිලට අතිරේකව ප්‍රවාහන ගාස්තු, වෙළෙඳ ආන්තිකයන් සහ ගැනුම්කරුවන් විසින් ගෙවිය යුතු බදු ඇතුළත් කොට ගැණුම්කරුවන්ගේ මිල සැකසේ.

## ආණ්ඩුවේ අසමත් වීම්

ආණ්ඩුවේ අසමත්වීම් යනු වෙළඳපොළ අසාර්ථක වීම වළක්වා ගැනීම සඳහා රජය විසින් ආර්ථිකය සඳහා කරනු ලබන මැදිහත්වීම් රාජ්‍ය අංශයට අවේණික වූ ඇතැම් දුර්වලතා කරණකොටගෙන අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොදී ආර්ථිකයේ තවත් අකාර්යක්ෂමතා බිහි කිරීම යි. ආණ්ඩුවේ අසමත් වීම කෙරෙහි බලපාන හේතු කිහිපයකි.

……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

……………………………………………………………………………………………………

### වෙළඳපොළ ආර්ථිකයක රජයේ කාර්ය භාර්ය

- සම්පත් කාර්යක්ෂමව බෙදාහැරිම

වෙළඳපොළ ආර්ථික යක් තුළ දක්නට ලැබෙන සම්පත් බෙදී යාමේ අකාර්යක්ෂමතාවය වැළක්වීම සඳහා රජය විසින් පහත ක්‍රියාමාර් ග අනුගමනය කරයි.

  - ශුභසාධන භාණ්ඩ පරිභෝජනයට පෙළඹවීම
  - පොදු භාණ්ඩ සැපයීම
  - ආර්ධ පොදු භාණ්ඩ සැපයීම
  - අවගුණ භාණ්ඩ සැපයීම සීමා කිරීම

- ආදායම් හා ධනය සාධාරණව බෙදාහැරිම

සාධාරණත්වය ස්ථාපිත කිරීම උදෙසා රජය විසින් පහත සඳහන් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කෙරේ.

  - ඉඩම් ප්‍රතිසංස්කරණය
  - ආදායම් හා ධන ව්‍යාප්තිය ඇති කිරීම
  - ධන සමුච්චනය පිළිබඳ සීමා පැනවීම

- සාර්ව ආර්ථික ස්ථායිතාව ඇති කිරීම

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය යොදා ගනිමින් උද්ධමනය සහ සේවා වියුක්තිය ඉවත් කිරීම තුළින් සාර්ව ආර්ථික ස්ථායිතාවය පවත්වා ගැනීමට කටයුතු කරයි.

- තිරසාර සංවර්ධනය

ආර්ථික, සමාජීය හා පාරිසරික අංශවල තුලනාත්මකව වැඩි දියුණු කිරීම තුළින් තිරසාර සංවර්ධනය සඳහා වූ වෙළෙඳපොළ ක්‍රමයක් පවත්වා ගැනීමට රජය කටයුතු කරයි


JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

## ෆිස්කල් ප්‍රතිපත්තිය හා එහි උපකරණ

සාර්ව ආර්ථික අරමුණු ළඟා කරගැනීම උදෙසා රාජ්‍ය වියදම්, බදු අය කිරීම් සහ ණය ගැනීම් සම්බන්ධව ගනු ලබන ක්‍රියාමාර්ග සහ සිදු කරන වෙනස්කම් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ලෙස හැඳින්වේ, තිරසාර ආර්ථිකයක් අත්පත් කර ගැනීමටත් දරිද්‍රතාවය පහත හෙළීමටත් මෙම ප්‍රතිපත්තිය උපයෝගී කර ගැනේ. ආර්ථික අවශ්‍යතාවය මත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ප්‍රධාන ස්වරූප තුනක් යටතේ දැක්විය හැක.

1. ..........................................................................................................................

2. ..........................................................................................................................

3. ..........................................................................................................................

රටක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියේ ස්වරූප දක්වන ලේඛනය වාර්ෂික අයවැය ලේඛනය ලෙස හැඳින්වේ, ඒ අනුව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය අයවැය ප්‍රතිපත්තිය ලෙස ද හඳුන්වයි. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියෙහි ප්‍රධාන අංශ දෙකකි.

- රාජ්‍ය වියදම
- රාජ්‍ය ආදායම

### රාජ්‍ය වියදම

ආපසු ගෙවීමක් සිදු නොවන රජයේ ගෙවීම් රාජ්‍ය වියදම් ලෙස හැඳින්වේ. රාජ්‍ය වියදම පහත පරිදි වර්ග කළ හැකිය.

- ........................................................
- ........................................................

➢ වර්තන වියදම්

අවුරුද්දකට වැඩි කාලයක් සඳහා නිෂ්පාදන ක්‍රියාවලියට යොදාගනු ලබන මූර්තවත්කම් අත්පත් කරගැනීම සහ ප්‍රාග්ධන සංක්‍රාම සඳහා කරන වියදම් හැර අනෙකුත් වියදම් සියල්ල වර් තන වියදම් සේ සැලකේ. වර් තන වියදම් ප්‍රධාන කොටස් 03 කි.

- භාණ්ඩ හා සේවා සඳහා කෙරෙන වර් තන වියදම්
- පොළී ගෙවීම්
- වර්තන සංක්‍රාම හා සහනාධාර



JMC vLearning "your virtual learning partner"

➢ ප්‍රාග්ධන වියදම්

ස්ථාවර වත්කම් අත්පත් කරගැනීමට උපකාරී වන, දරනු ලබන වියදමේ ප්‍රතිලාභ වියදම දරන ලබන කාලයෙන් ඔබ්බට පැතිර යන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස හැඳින්වේ. ප්‍රාග්ධන වියදම තුළින් රජයේ ප්‍රාග්ධන තොගයේ ඉහළ යාමක් සිදු වන අතර ආර්ථික වර්ධනය සඳහා උපකාරි වේ. ප්‍රාග්ධන වියදම් කොටස් දෙකකින් සමන්විත ය.

- මුර්තවත්කම් අත්පත් කරගැනීම
- ප්‍රාග්ධන පැවරුම්

✚ රාජ්‍ය ආදායම

රජයේ නොයෙකුත් කාර්යයන් ඉටු කිරීම සඳහා මුදල් නොයෙකුත් මාර්ගවලින් රැස් කරගැනීම රාජ්‍ය ආදායම ලෙස සැලකේ. රාජ්‍ය ආදායමේ ප්‍රධාන මූලාශ්‍ර 02 කි.

..........................................................

..........................................................

✚ ෆිස්කල් ප්‍රතිපත්තිය හා ව්‍යාපාර කෙරෙහි එහි බලපෑම

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ප්‍රධාන ස්වරූප තුනකින් ක්‍රියාත්මක කළ හැකිය. එනම්, සංකෝචනාත්මක, ප්‍රසාරණාත්මක හා මධ්‍යස්ථ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ලෙසයි. මෙම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියේ ක්‍රියාකාරිත්වය පෙන්නුම් කරනුයේ අයවැය ලේඛනය මගිනි. රාජ්‍ය වියදමට වඩා රාජ්‍ය ආදායම ඉහළ අගයක් ගන්නා විට අයවැය ලේඛනයේ අතිරික්තයක් ලෙස හඳුන්වන අතර, රාජ්‍ය ආදායම ඉක්මවා යන රාජ්‍ය වියදම අයවැය ලේඛනයේ හිගයක් ලෙසත් හැඳින්වේ. සාර්ව ආර්ථික අරමුණු ළඟා කරගැනීම උදෙසා රජයේ ආදායම් සහ වියදම්වල වෙනස්කම් සිදු කිරීම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය තුළින් සිදු වේ. රජයේ ආදායම් සහ වියදම් තත්ව සහ ඒවායේ සංයුතිය වෙනස් කිරීමෙන් සමස්ත ඉල්ලුම සහ නිමවුම් මට්ටමත්, සේවා නියුක්තියත්, සම්පත් බෙදී යාමේ රටාවත්, ආදායම් ව්‍යාප්ති රටාවත් කෙරෙහි සැළකිය යුතු බලපෑමක් කළ හැකිය.

රාජ්‍ය අයවැය ලේඛනයේ අතිරික්තයක් පවතින අවස්ථාව සංකෝචනාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ලෙස හැඳින්වේ. මන්ද, රජයේ වියදමට වඩා රජයේ ආදායම වැඩි වන විට සමස්ත ඉල්ලුම කෙරෙහි සංකෝචනාත්මක බලපෑමක් ඇති කරන හෙයිනි. එබැවින් සමස්ත වියදම් ප්‍රවාහයේ විදීම්වලට වඩා කාන්දුවීම් විශාල වේ. එවිට මූර්ත නිෂ්පාදනය සහ සේවා නියුක්තිය කෙරෙහි සංකෝචනාත්මක බලපෑමක් ඇති කරයි.


JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

රාජ්‍ය අයවැය ලේඛනයේ හිගයක් පවතින අවස්ථාව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියේ ප්‍රසාරණාත්මක බලපෑම ලෙස හඳුනා ගැනේ. රාජ්‍ය ආදායම් හෙවත් බදු අය කිරීමට වඩා රාජ්‍ය වියදම වැඩි වන විට සමස්ත ඉල්ලුම කෙරෙහි ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති කරයි. විදීම්වලට වඩා කාන්දුවීම් අඩුවේ. එවිට මූර්ත නිෂ්පාදනය සහ සේවා නියුක්තිය කෙරෙහි ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති කරයි.

අයවැය ලේඛනය තුලනය වූ අවස්ථාව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියේ මධ්‍යස්ථ අදියර ලෙස හැඳින්වේ. එම අවස්ථාවේදී රජයේ වියදම පියවා ගැනීමට රජයේ ආදායම ප්‍රමාණවත් වේ. එවිට මූ ජාතික නිෂ්පාදනය කෙරෙහි උදාසීන තත්වයක් ඇති කරයි. රාජ්‍ය ආදායම රාජ්‍ය වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත් නොවන විටකදී ණය ගැනීමට සිදු වේ. එම තත්වය මත ආර්ථිකයේ පොළී අනුපාතිකය ඉහළ යා හැකිය. ඉහළ පොළී අනුපාතිකයන්ගේ බලපෑම ආයෝජනය දිරිමත් නොකිරීමට හේතු වේ. මෙම තත්වය අනුව රාජ්‍ය වියදම ඉහළ යාම පුද්ගලික අංශයේ ආයෝජනය අඩු කිරීමට හේතු වේ.

❖ රජයේ අයවැය, සෘජු හා වක්‍ර බදු
(The government budget direct and indirect taxation)

- රාජ්‍ය අයවැය ලේඛනය හා වරපාර කෙරෙහි එහි බලපෑම

ඉදිරි වසර තුලදී රජය විසින් රජයේ කටයුතු සඳහා දැරීමට අපේක්ෂිත වියදමත් එම වියදම් පියවා ගැනීම සඳහා මුදල් රැස් කර ගන්නා මාර්ග පිළිබඳව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර සම්මත කර ගනු ලබන වාර්තාව රාජ්‍ය අයවැය ලේඛනය ලෙස හැඳින්වේ එය රජයේ ඉදිරි මූල්‍ය සැලැස්ම සහ ඉදිරි දැක්ම පිළිබිඹු කෙරේ.

රාජ්‍ය අයවැය ලේඛනයේ රාජ්‍ය ආදායම් හා රාජ්‍ය වියදම් ගැළපීමෙන් අය වැය ශේෂය ලබා ගන්නා අතර එම අයවැය ශේෂයෙහි ස්වභාවය අනුව ප්‍රධාන අයවැය සංකල්ප තුනක් හඳුනා ගත හැකි වේ. එනම්,

- හිග අයවැය - රාජ්‍ය වියදම රාජ්‍ය ආදායමට වඩා වැඩි අවස්ථාවක් හිඟ අයවැයක් නම් වේ
- අතිරික්ත අයවැය - රාජ්‍ය වියදම රාජ්‍ය ආදායමට වඩා අඩු අවස්ථාවක් අතිරික්ත අයවැයක් නම් වේ
- තුලිත අයවැය - රාජ්‍ය වියදමත් රාජ්‍ය ආදායමත් සමාන වන අවස්ථාවක් තුලිත අයවැයක් නම් වේ


JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

❖ අයවැය හිඟය හා මූල්‍යනය කරන ආකාර

ඉදිරි වර්ෂයක් තුළ ආණ්ඩුවේ අපේක්ෂිත ආදායමට වඩා එම වර්ෂය තුළ වියදම් කිරීමට අපේක්ෂිත මුළු වියදම ඉක්මවා යන අවස්ථා පවතීආණ්ඩුවේ ආදායමට වඩා . ආණ්ඩුවේ වියදමඉක්මවා යන විට ඇති වන අයවැය හිඟය මූල්‍යයනය කිරීමට යොදා ගන්නා ප්‍රධාන මූලාශ්‍රය වන්නේ රාජ්‍ය ණය ගැනීම වේ.

අයවැය හිඟය මුල්‍යයනය කිරීමට ණය ලබා ගන්නා ප්‍රධාන මූලාශ්‍ර දෙකකි.

- දේශීය මූලාශ්‍ර

දේශීය මුලාශ්‍ර නැවත කොටස් 2 කි

1. ……………………………………………………………
2. ……………………………………………………………

01. වෙළඳපොළ මුලාශ්‍ර

ආණ්ඩුව මූල්‍ය වෙළෙඳපොළ තුළ පවතින මූලාශ්‍ර මගින් ණය ලබා ගැනීමක් ලෙස හඳුන්වනු ලැබේ.දේශීය වෙළෙඳපොළ මූලාශ්‍ර නැවත කොටස් දෙකකට බෙදා වෙන් කළ හැකි ය.

1. ……………………………………………………………
2. ……………………………………………………………

- බැංකු ක්‍රමයෙන් ලබා ගන්නා ණය

මහා බැංකුව ඇතුළු වෙනත් වාණිජ බැංකු මගින් ලබා ගන්නා ණය, බැංකු ක්‍රමයෙන් ලබා ගන්නා ණය හෙවත් උද්ධමනකාරි මූලාශ්‍ර මගින් ණය ලබා ගැනීම ලෙස ද හඳුන්වයි. මහ බැංකුව ඇතුළ වාණිජ බැංකු මගින් අයවැය හිඟය පියවීමට ණය ලබා ගන්නා විට ආර්ථිකයේ මූල්‍ය ප්‍රසාරණය සිදු වේ.

- බැංකු නොවන මූලාශ්‍ර මගින් ලබා ගන්නා ණය

ජාතික ඉතිරි කිරීමේ බැංකුව, සංවර්ධන බැංකු, රක්ෂණ සමාගම්, සේවක අර්ථසාධක අරමුදල වැනි වාණිජ බැංකු නොවන ණය මැවීමේ හැකියාවක් නැති ආයතනවලින් ණය ලබා ගැනීම, බැංකු නොවන ණය ලබා ගැනීම් ලෙස හඳුන්වයි. බැකු නොවන මූලාශ්‍ර මගින් ණය ලබා ගැනීම නිසා මුදල් මැවීමක් සිදු නොවන බැවින් මුදල් සැපයුමට බලපෑමක් ඇති නොවේ.


JMC vLearning "your virtual learning partner"
JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

02. වෙළඳපොළ නොවන මූලාශ්‍ර

වෙළෙඳපොළට මැදිහත් නොවී මුදල් ණයට ගැනීම වෙළෙඳපොළ නොවන මූලාශ්‍ර ලෙස හඳුන්වයි. මෙහිදී ආණ්ඩුවේ ආයතන තුළ ඇති තැම්පතු හා අතිරික්ත අරමුදල් තාවකාලිකව අයවැය හිඟය මූල්‍යයනය කිරීමට ලබා ගනී.

- විදේශ මූලාශ්‍ර

විදේශීය ණය හා ප්‍රදාන මේ යටතේ ගැනේ.

විදේශීය ණය සහ දීමනා දේශීය මුදල් වලට පරිවර්තනය කළහොත් පමණක් ආර්ථිකයේ ප්‍රසාරණාත්මක බලපෑම් ඇති විය හැකි ය.

විදේශීය ණය හා දීමනා

වෙළෙඳපොළ නොවන මූලාශ්‍ර ලෙස හඳුන්වන අයවැය හිඟය මූල්‍යයනය කිරීම සඳහා විදේශීය දීමනාවලට වඩා විදේශීය ණය වැඩි වැදගත්කමක් පවතී.

අයවැය හිඟය පියවීම සඳහා විදේශීය රජයකින්, අන්තර්ජාතික මූල්‍ය ආයතනවලින් හෝ ජාත්‍යන්තර වෙළෙඳපොළවලින් ලබා ගන්නා ණය විදේශීය ණය මූලාශ්‍ර ලෙස හැඳින්වේ. මෙලෙස ලැබෙන ණය පවතින ණය කොන්දේසිවල ස්වරූපය අනුව සහනදායි ණය හා සහනදායි නොවන ණය වශයෙන් වෙන් කෙරේ.

සහනදායි ණයවල දී කොන්දේසි රහිතව හෝ ඉතා අඩු පොළියක් යටතේ හෝ ණය ගෙවීමේ විරාම කාලයක් ලබා දී හෝ එම ණය ලබා දෙයි. සහනදායි නොවන ණය වාණිජ ණය ලෙසද හඳුන්වයි. ඉහළ පොළී පිරිවැයක් හා විවිධ කොන්දේසි යටතේ ලබා ගන්නා ණය සහනදායි නොවන ණය ලෙස හැඳින්විය හැකි ය.

දේශීය ණය හා විදේශීය ණය මූලාශ්‍ර මගින් ණය ලබා ගැනීම ශ්‍රී ලංකා ආර්ථිකයට බලපාන ආකාරය රාජ්‍ය ණයවල ආර්ථික ප්‍රතිවිපාක ලෙස හඳුන්වයි. අයවැය හිඟය මූල්‍යයනය කිරීමට යොදා ගන්නා ණය මූලාශ්‍රවල ස්වභාවය මත එම ප්‍රතිවිපාක තීරණය වේ. අයවැය හිඟය අඛණ්ඩව ඉදිරියට යාම හා රාජ්‍ය ණය ඉහළ යාම නිසා ආර්ථිකයේ අයහපත් ප්‍රතිවිපාක දෙකක් ඇති කරයි.

01. වෙළෙඳපොළ පොලී අනුපාතිකය ඉහළ යාම (තෙරපුම් බලපෑම)

අයවැය හිගය මුල්‍යයනය කිරීම සඳහා ආණ්ඩුව ණය ඉල්ලුම් කිරීමත් පෞද්ගලික අංශය ණය ඉල්ලීමත් හේතුවෙන් ඇති වන තරගය නිසා ණය පොලී අනුපාතිකය ඉහළ යයි. මහ බැංකුව ඇතුළු වාණිජ බැංකු මූලාශ්‍ර ණය ලබා ගැනීම ආර්ථිකයට අයහපත් ප්‍රතිවිපාක ලබා දෙයි. සීමිත මුල්‍ය සම්පත් ප්‍රමාණයක් සඳහා රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශය අතර තරඟකාරී බවක් ඇති වීමෙන් පෞද්ගලික අංශයේ ආයෝජනය දුර්වල වේ.


JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972
JMC vLearning "your virtual learning partner"

02. උද්ධමනකාරී බලපෑම

වෙළඳපොළ බැංකු මූලාශ්‍ර මඟින් ණය ලබා ගන්නා විට මුදල් මැවීමක් සිදුවන බැවින් ආර්ථිකයේ මුදල් සැපයුම ඉහළ යාමෙන් උද්ධමනකාරී බලපෑමක් ඇතිවේ.

- වෙළෙඳපොළ නොවන මූලාශ්‍ර මගින් අයවැය හිඟය මූල්‍යයනය කිරීමට ණය ලබා ගැනීමෙන් එවැනි අයහපත් ප්‍රතිවිපාක ඇති නොවේ.

උදාහරණ : රජයේ ආයතන සතුව ඇති අතිරික්ත මුදල් සංචිතයන් වර්ෂ අවසානයේ අයවැය හිඟය පියවීමට යොදා ගැනීම, පරිපාලන ණය වේ. මෙමගින් මූල්‍ය ප්‍රසාරණයක් ඇති නොවන අතර උද්ධමනකාරි බලපෑම් ඇති නොවේ.

♠ විසර්ජන කෙටුම්පත

ඉදිරි වසර සඳහා දැරීමට අපේක්ෂිත වියදම් දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශ වශයෙන් වෙන් කර ලබා ගැනීමට අපේක්ෂිත අය මාර්ග සඳහන් කොට ආදායම් වියදම් අතර පරතරයක් ඇත්නම් එය මූල්‍යනය කරනු ලබන ආකාරය දැක්වෙන කෙටුම්පත විසර්ජන කෙටුම්පත යනුවෙන් හැඳින්වේ.

♠ පරිපූරක ඇස්තමේන්තුව

විසර්ජන පනත සම්මත වූවායින් පසුවත් අලුතින් මුදල් අවශ්‍යතාවක් ඇති වූ විට ඒ සඳහා පාර්ලිමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීම සඳහා අදාළ අමාත්‍යාංශයේ ඇමතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන ඇස්තමේන්තුව පරිපූරක ඇස්තමේන්තුව නම් වේ.

♠ අතුරු සම්මත ගිණුම

කිසියම් අනපේක්ෂිත සිදුවීමක් කොටගෙන නියමිත කාලය තුළදී අයවැය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගැනීමට නොහැකි වූ විට දී එය සම්මත කර ගන්නා තුරු ඉදිරි මූල්‍ය වර්ෂය සඳහා අදාළ අමාත්‍යාංශ විසින් දැරිය යුතු වියදම් රජයේ ඒකාබද්ධ අරමුදලින් වෙන් කර ගැනීම සඳහා තාවකාලිකව ඉදිරිපත් කළ යුතු ලියවිල්ල අතුරු සම්මත ගිණුම් නම් වේ.


JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

## රාජ්‍ය අයවැය පරීක්ෂා කිරීම සඳහා යොදා ගනු ලබන මිනුම්

- වර්තන ගිණුමේ ශේෂය - ප්‍රධාන ලැබීම් හැර රජයේ මුළු අයභාරයෙන් පුනරාවරතන වියදම් හෙවත් වර් තන වියදම් අඩු කළ පසු ඉතිරි වන ශේෂයයි.
- සමස්ත ගිණුමේ ශේෂය - ප්‍රධාන ලැබීම් ඇතුළුව රජයේ මුළු අයභාරයෙන් පුනරාවරතන සහ ප්‍රාග්ධන වියදම් සහිත රජයේ මුළු වියදම් අඩු කළ පසු ඉතිරි වන ශේෂයයි.
- ප්‍රාථමික ගිණුමේ ශේෂය - ප්‍රධාන ලැබීම් ඇතුළුව රජයේ මුළු අයභාරයෙන් රාජ්‍ය ණය සඳහා ගෙවූ පොළී වියදම් ඇතුළත් නො වූ පුනරාවර්තන වියදමත්, ප්‍රාග්ධන වියදමත් යන සංරචක දෙකකින් සමන්විත වූ රජයේ වියදම් අඩු කළ පසු ඉතිරි වන ශේෂයයි.
- ශුද්ධ මූල්‍ය හිඟය - ප්‍රධාන ලැබීම් ඇතුළුව රජයේ මුළු අයභාරයෙන් ණය වාරික ගෙවීම අඩු කළ පසු රජයේ මුළු වියදමත් අතර වෙනසයි.

## බදු වර්ග

විනැන් කිරීමේ හැකියාව මත බදු වර්ග 02 කි

- සෘජු බදු

සෘජු බද්දට හසු වන පුද්ගලයා හෝ ආයතන විසින්ම හෝ අදාළ බද්ද ගෙවීමට සිදු වන අතර එය වෙනත් පාර්ශවයකට විතැන් කළ නොහැක. මෙහිදී බද්දට යටත් වූ පුද්ගලයා විසින්ම බදුබර දැරිය යුතු වේ. නිදසුන් ලෙස ආදායම් බදු සහ දේපළ බදු දැක්විය හැකිය.

- වක්‍ර බදු

යම් බද්දක් ගෙවීමට නෛතිකව නියම වූ පුද්ගලයා විසින් එම බදු බර වෙනත් අයකු මත විතැන් කරනු ලබයි නම් එය වක්‍ර බද්දක් ලෙස හැඳින්වේ.

## සාර්ව ආර්ථික මිනුම් හා ව්‍යාපාර කෙරෙහි එහි බලපෑම

ආර්ථික වෘද්ධිය කිසියම් රටක මූර්ත දළ දේශීය නිෂ්පාදිතය අඛණ්ඩව ඉහළ යාම ආර්ථික වෘධිය වන අතර රටක් ආර්ථික වෘද්ධියක් අත් කර ගැනීමට නම් විවිධ ව්‍යාපාර ක්ෂේත්‍රයන්හි දියුණුවක් අත්කර ගැනීම අත්‍යවශ්‍ය සාධකයකි. මේ අනුව ආර්ථික වෘද්ධියක් අත් කර ගැනීම තුළින් ව්‍යාපාර ක්ෂේත්‍රයේ නව ව්‍යාපාර අවස්ථාවන් හා ව්‍යාපාර දියුණුව අත්කර ගත හැකිය.


JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

## සාර්ව ආර්ථික මිනුම්/ අරමුණු

- පූර්ණ සේවා නියුක්තිය

ආර්ථිකය සතු සම්පත් පූර් ණ වශයෙන් උපයෝජනය කිරිම පූර්ණ සේවා නියුක්තිය වන අතර ඒ තුළින් ව්‍යාපාර සඳහා අවශ්‍ය මානව සම්පත් හා භෞතික සම්පත් ප්‍රශස්තව ලබා ගැනීමේ හැකියාවක් ඇති අතර ව්‍යාපාර සඳහා අවශ්‍ය පුහුණු ශ්‍රමය මෙහිදී සලකා බැලේ.

- ආදායම් බෙදී යාමේ සාධාරණත්වය

ආර්ථිකය තුළ වෙසෙන සියලුම ආර්ථික කාරකයන් අතර ආදායම් හා ධනය ප්‍රශස්තව බෙදා හැරිම සාධාරණ ආදායම් ව්‍යාප්තිය වන අතර මහ පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රයන්ට මෙන්ම කුඩා පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රයන්ට ද මෙය සෘජුව බලපෑම් කරයි.

- මිල ස්ථායිතාව

උද්ධමනයක් හෝ අවධමනයකින් තොරව ආර්ථිකය ස්ථාවරව පවත්වා ගෙන යාම මිල ස්ථායීතාවය ලෙස හැඳින්වේ. එනම් අවම උද්ධමන අනුපාතයක් යටතේ ආර්ථිකය පවත්වා ගෙන යාමයි. මෙය ව්‍යාපාර කෙරෙහි සෘජුව බලපෑම් කරන අතර ව්‍යාපාර පිරිවැය හා ව්‍යාපාර ලාභය කෙරෙහි බලපෑම් එල්ල කරයි.

- තිරසාර සංවර්ධනය

පරිසරයේ ගුණාත්මක බව රැක ගනිමින් නිෂ්පාදනය ඉහළ නංවා ගැනීමත් සියලු ජන කොටස් අතර සාධාරණව ප්‍රතිලාභ බෙදී යාමටත් සැලැස්වීම තිරසාර සංවර්ධනය ලෙස හැඳින්වේ. ඒ අනුව තිරසාර සංවර්ධනය යනු ආර්ථික, පාරසරික හා සමාජයීය යන සියලුම අංශයන්හි තුලනාත්මක වර්ධනයක් ඇති කරලීමය. එබැවින් ව්‍යාපාර තම ආදායම ඉහළ නංවා ගත යුත්තේ පරිසරයේ තුලනාත්මකභාවය ආරක්ෂක්ෂා කරමින් බව මෙහිදී අවධාරණය කරයි.

- ගෙවුම් ශේෂ සමතුලිතතාව

විදේශ රටවල් සමග සිදු කරන ගනුදෙනු වලදී ගෙවුම් ශේෂ අර්බුදවලින් තොරව ආර්ථිකය පවත්වාගෙන යාම මින් අදහස් වේ. එනම් ගෙවුම් ශේෂ අතිරික්තයක් පවත්වා ගෙන යාම හෝ ගෙවුම් ශේෂ හේගය අඩු කර ගැනීමයි. මේ අනුව ආනයන කටයුතු හා අපනයන කටයුතු බලපෑමකින් තොරව ඉටු කර ගැනීම සඳහා ගෙවුම් ශේෂ සමතුලිතතාව ආරක්ෂා කර ගැනීම ව්‍යාපාර කෙරෙහි වැදගත් වේ


JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972